සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

30814

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය / நேரம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ..................................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ......................................

## I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසට මේ පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටස සමඟ අමුණා භාර දෙන්න.

---

- 1, 2 ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට අදාළ ව නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) **'තණ්හාව නිසා දිගින් දිගට ම කරදරයට පත් වීම'** යන අරුතට ගැළපෙන ප්‍රස්තාව පිරුළ,

i. ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගේ
ii. අටුව කඩා පුටුව හැදුවා වගේ
iii. වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වගේ
iv. බළලුන් ලවා කොස් ඇට බාවනවා වගේ

(02) **'අනුනවයෙන් බේරුණා'** යන රූඪියට ගැළපෙන අරුත වනුයේ,

i. සිතා මතා බේරීම
ii. යාන්තමින් බේරීම
iii. අනුනව වාරයක් බේරීම
iv. ආයාසයෙන් තොර ව බේරීම

- හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(03) .................... උදෑසනින් පාසලට ළඟා වීමු.

i. මා  ii. අපි  iii. ඔහු  iv. ඇය

(04) ගොවියෝ කුඹුරු ......................................

i. වපුරයි  ii. වපුරති  iii. වපුරන්නෝ ය  iv. වැපිරේ

(05) පියා ................................... රැක ගත්තේ ය.

i. දරුවෝ  ii. දරු පැටව්  iii. දරුවන්  iv. දරුවෙක්

- 6 සිට 8 දක්වා ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(06) i. නිදර්ශණ  ii. නිදර්ෂණ  iii. නිදර්ශන  iv. නිධර්ශන

(07) i. ඓතිහාසික  ii. ඓතිහාසික  iii. අයිතිහාසික  iv. ඓයිතිහාසික

(08) i. සණ්වාරය  ii. සන්වාරය  iii. සණ්ඨාරය  iv. සන්ඨාරය



LIVEWORKSHEETS

- ප්‍රශ්න අංක 9 සිට 11 දක්වා ප්‍රශ්නවලට පද තුනක් අර්ථයෙන් සමාන ය. සමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.

(09) i. සඳ ii. සොමි iii. දිනකර iv. තාරපති

(10) i. අහස ii. ගගන iii. ශුවන iv. මහී

(11) i. වනිතාව ii. ගැහැනිය iii. වෙළඹ iv. කත

- ප්‍රශ්න අංක 12 සිට 15 දක්වා ප්‍රශ්නවලට අක්ෂර මාලාව ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(12) නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර ගණන කීය ද?
i. 20කි. ii. 18කි. iii. 10කි. iv.12කි.

(13) සෑම පදයක ම මහාප්‍රාණ අක්ෂර යෙදී ඇති පිළිතුර තෝරන්න .
i. ආර්ථික, ලේඛන ii. සෞඛ්‍ය, අහල
iii. ඇතා, ඇස iv. අහස, පය්‍රි

(14) 'සාර පලය අඹ දඹ රඹ ද වල්පිට' යන පද්‍ය පදයේ යෙදී ඇති සඤ්ඤක අකුරු ගණන වන්නේ,
i. 3කි. ii. 5කි. iii. 2කි. iv. 4කි.

(15) <u>කු</u>කිරි, <u>කු</u>රුලු යන වචනවල ඉරි ඇඳි අකුරේ පිල්ලම් පිළිවෙළින් දැක්වෙන්නේ,
i. පාපිල්ල, පා පිල්ල ii. ඇලපිල්ල, පාපිල්ල
iii. කෙටි ඇදපිල්ල, කෙටි පාපිල්ල iv. ඇලපිල්ල, කෙටි පාපිල්ල

(16) "බටහිර අහස රත් පැහැ කරමින් සූර්යයා ගිනිබෝලයක් මෙන් බැස යයි" යන වාක්‍යයේ උපමා උපමේය වෙන් කර දක්වන්න.

උපමාව : ..........................................................................................................

උපමේය: ..........................................................................................................

(17) '<u>රන්</u> කරඬුව රැගත් ඇතා <u>ශාන්ත</u> ගමනින් පෙරහැරේ ගමන් කරයි' යන වාක්‍යයේ ඉරි ඇඳි පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. නාම විශේෂණ, නාම විශේෂණ
ii. නාම විශේෂණ, ක්‍රියා විශේෂණ
iii. ක්‍රියා විශේෂණ, ක්‍රියා විශේෂණ
iv. ක්‍රියා විශේෂණ, නාම විශේෂණ

(18) '**විශේෂ**' යන වචනයේ විරුද්ධාර්ථ පදය වන්නේ ,
i. අතිවිශේෂ ii. සුවිශේෂ iii. සාමාන්‍ය iv. අසාමාන්‍ය

(19) '**පුංචි පැළේ ගස වෙනා**' යන ස්වයං ලිඛිත චරිතාපදානය කාගේ ද?
i. මාර්ටින් වික්‍රමසිංහ ii. කුමාරතුංග මුනිදාස
iii. ඩී.පී වික්‍රමසිංහ iv. කේ. ජයතිලක

(20) '**උදේනි පුර සැණකෙළිය**' ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
i.ගුත්තිල කාව්‍යය ii. ගුත්තිල ජාතකය iii. සංදේශ කාව්‍යය iv. කාව්‍යශේඛරය

(ලකුණු 2x20 = 40)



LIVEWORKSHEETS